1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජිතායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජිතායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජිතායතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජිතායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජිතායතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයකරන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජිතායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජිතායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජිතායතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2හි 29 ඡේදය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ අතිරික්තය සමඟ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය සැසඳිය යුතු අතර එය මුදල් ප්‍රවාහයේ කොටසක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල සටහනක් වශයෙන් පෙන්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මෙම ඌණතාවය හදුනාගෙන ඇති අතර, මෙය නිවැරදි කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සිදුකරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය.
(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 47 ඡේදයට ප්‍රකාරව සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන කර ගිණුම්ගත කළයුතු වුවත් 2024දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.3,231,216,479 ක් වූ ඉඩම් 05 ක් අවසන් වරට ප්‍රත්‍යාගණනය කර ඇත්තේ 2013 වර්ෂයේ වන අතර ඉන්පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.	රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 මගින් දේපල, පිරියත, උපකරණ ගිණුම් තැබීම සඳහා මාර්ගෝපදේශය සපයනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් කරණු ලබන පැහැදිලිකිරීම් වලට අනුව මෙම ප්‍රමිතියට අදාලව වත්කම් පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය මත ගිණුම් තැබිය හැකිය. පිරිවැය ආකෘතිය යටතේ වත්කමක ශුද්ධ අගය 0 වත්කම් පවත්වාගෙන යා හැකිය. නැතහොත් වත්කම් ගිණුම් ගතකිරිම ප්‍රත්‍යාගණන ආකෘතිය යටතේ සිදුකල හැකිය. මෙම විගණන නිරීක්ෂණය ඉදිරිපත් කරනුයේ ප්‍රත්‍යාගණන ආකෘතිය යටතේ වන 47 ඡේදයට අනුවය .	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් රු.13,462,445ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.10,579,813ක් ලෙස දක්වා තිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායෑම් රු.2,882,632 ක් අඩුවෙන් දැක්වුණි.	මෙම රු. 2,882,632 ක මුදල වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පෙන්විය යුතු වුවද, අනිකුත් වියදම් තුල පෙන්වීම සිදුව ඇත.	දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතුය.
(ආ) ව්‍යාපෘති වියදම රු.52,987,109 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.40,084,809 ක් ලෙස දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාම් රු.12,902,300 අඩුවෙන් දැක්වුණි.	සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති වියදම රු.52,987,109 විය. නමුත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත්තේ අත්තිකාරම් පියවීමට අදාල මුදල වන රු.12,902,300 ක ප්‍රමාණය අඩුවෙනි. මෙම ඌණතාවය ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරනු ලැබේ.	ව්‍යාපෘති වියදම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය.
(ඇ) සමාලෝචිත වර්ෂයේ උපදේශන සේවා ආදායම් ලැබීම් රු.44,247,430 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ රු.87,142,128 ක් ලෙස දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම් රු.42,866,698 ක් වැඩියෙන් දැක්වුණි.	2024 වර්ෂයේ උපදේශන සේවා ආදායම රු. 44,247,430 ක් විය. අනිකුත් ව්‍යාපෘති ලැබීම් ද ඇතුලුව ආදායම රු. 87,142,128 ක් විය. මෙම සමස්ථ ආදායම උපදේශණ ව්‍යාපෘතිවලට අදාලව දැක්වීම මත මුදල් ප්‍රවාහය තුල උපදේශණ අදායම රු. 42,866,698 වැඩියෙන් සඳහන්කර ඇත. මෙම ඌණතාවය ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරනු ලැබේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒම් නිවැරදිව දැක්විය යුතුය.
(ඈ) උපදේශන සේවා වියදම රු.7,602,728 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.45,547,441ක් ලෙස දැක්වීම හේතුවෙන් උපදේශන සේවා වියදම් වලින් මුදල් ගලායාම් රු.37,944,713 වැඩියෙන් දැක්වුණි.	සමාලෝචිත වර්ෂයේ උපදේශණ සේවා වියදම රු.7,602,728 ක් වුවද උපදේශණ නොවන ව්‍යාපෘති ඇතුළු අනිකුත් ව්‍යාපෘති වලට අයත් වියදම්ද මේ තුල අන්තර්ගත කර තිබුණි. එබැවින් උපදේශණ ව්‍යාපෘතින්හි වියදම වශයෙන් රු. 45,547,441 ක් සටහන් කර ඇත. මෙය ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කරනු ලැබේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායෑම් නිවැරදිව දැක්විය යුතුය.
(ඉ) මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැවත හරවා යවා තිබුණු රු.9,604,532 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායෑම් ලෙස දක්වා නොතිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායෑම් අඩුවෙන් දැක්වුණි.	මෙම රු. 9,604,532ක මුදල වියදමක් ලෙස සැලකිය නොහැක. මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ප්‍රතිපාදන තුලින් නැවත හරවා යවන ලද මුදල වන බැවින් ආදායමින් වියදම අඩුකර පෙන්වා ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලායෑම් නිවැරදිව සටහන් කළ යුතුය.

(ඊ) සමුද්‍රීය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබූ අත්තිකාරම් මුදලින් අඩුකර නොගත් රු.1,171,732 ක මුදල අඩුකර ගත්සේ සලකා කෙරීගෙන යන වැඩ වටිනාකම ගිණුමට හර කිරීම නිසා කෙරීගෙන යන වැඩ එම වටිනාකමින් වැඩියෙන් සහ වෙනත් අත්තිකාරම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.	සමුද්‍රීය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමෙහි කොන්ත්‍රාත්තුව වෙනුවෙන් පියවන ලද දෙවන බිල්පතට අනුව අයකර නොගත් අත්තිකාරම් මුදලින් කොටසක් වූ රු. 1,171,732 ක මුදල සංශෝධන සිදුකිරීමේදී අත්තිකාරම් ගිණුම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන් පෙන්වීමේ දෝෂය නිවැරදි කරන ලදී.	කොන්ත්‍රාත් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් නිවැරදිව ගිණුම් කළ යුතුය.
(උ) පෞද්ගලික ආයතනයක් වෙත බදු දී තිබූ රු.16,868,610 ක තක්සේරු වටිනාකමක් සහිත මත්ස්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රයක් 2021 වර්ෂයේදී නැවත නියෝජිතායතනය වෙත පවරාගෙන තිබුණද 2020 ජූනි 05 දින සිට මාස 31 දක්වා කාල සීමාවට අදාළ රු.4,650,000 ක්වූ හිඟ බදු මුදල් එම ආයතනයෙන් අයකර ගැනීමට අදාළ සටහන් ගිණුම්වල ගලපා නොතිබුණු අතර අදාළ මුදල් 2025 මැයි 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම යන්ත්‍රයේ පළමු බදු ගැණුම්කරු විසින් යන්ත්‍රයේ පැවති දෝෂ සහගත තත්වයන් මත යන්ත්‍රය නැවත ආයතනය වෙත බාර ගන්නා ලෙස දන්වන ලදී. මේ මත ගාස්තු අයකිරීමක් සිදුකර නොමැත. නැවත අභිලාශයන් කැඳවා වෙනත් ආයතනය වෙත මෙම යන්ත්‍රය කුළී පදනම මත ලබාදීමට කටයුතු කරන ලදී. එම ආයතනය විසින් 2024 වර්ෂයේ ජනවාරි මස සිට ගෙවීම් ආරම්භ කරන ලදි. නමුත් වාරික 02 ක් පමණක් ගෙවීම් කරන ලද අතර යන්ත්‍රය දෝෂ සහිත වීම මත නැවත යන්ත්‍රය ආපසු භාරගන්නා ලෙස 2024 මාර්තු 11 දිනැති ලිපිය මගින් දැනුවත් කර ඇත.	මෙම යන්ත්‍රයට අදාළ ගිවිසුම අවසන් කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් අයකර ගැනීම පිළිබඳ, ක්‍රියාමාර්ගයක් ගත යුතුය.
(ඌ) විදේශගත ආපසු සේවයට වාර්තා නොකළ පර්යේෂණායතනයේ නිළධාරින් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ බැඳුම්කර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ එකතුව රු.2,575,863 ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර නියෝජිතායතනයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	මෙම ගිවිසුම් ආයතන සමග අත්සන් කරන ලද බැවින් ලද මුදල් ආයතනයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීමේදි අපගේ ස්වයං ඉපයුම් ඇස්තමේන්තුව අය වැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, ප්‍රතිපාදන ලබාදීමේදී මෙම මුදලද සැලකිල්ලට ගනු ලබන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.	ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(එ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ එකතුව රු.2,395,920ක්වූ භාණ්ඩ අයිතම් 07 ක් දේපළ පිරියත උපකරණ යටතේ ගිණුම්ගත නොකර ව්‍යාපෘති වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.	මෙම වරද 2025 වර්ෂයේ ගිණුම් තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මිලදීගනු ලබන භාණ්ඩ නිවැරදි අයිතම යටතේ ගිණුම් ගතකළ යුතුය.
(ඒ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020හි II කොටසෙහි 7.2 ඡේදයෙහි මාර්ගෝපදේශ අංක 11 ප්‍රකාරව සෘජු	මෙම උපදේශන සේවා සඳහා ගිණුම් තැබීම කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 10 මත වන අතර එහිදී ව්‍යාපෘතියට අදාල	උපදේශන සේවා වියදම් වල සෘජු පිරිවැය හා

	පිරිවැය හා පොදු කාර්යය පිරිවැය මත පදනම්ව ගාස්තු ඇස්තමේන්තු කළ යුතු වුවත් සෘජු පිරිවැය, පොදු කාර්ය පිරිවැය හා එක් එක් නිලධාරීන්ට ගෙවූ සෘජු හා වක්‍ර වියදම කොපමණද යන්න ලෙජරයේ වෙන් වෙන්ව නොදක්වා රු.66,153,660 ක් උපදේශන සේවා වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.	කාර්යයන්වල කාර්යයසාධනය පදනම් කරගෙන ව්‍යාපෘතිය භාර නිලධාරීන් විසින් නම් කරනු ලබන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රේටය පදනම් කර ගනිමින් ගණනය කිරීම සිදු කරනු ලබයි. එසේ ගණනය කිරීමේදී ලද ව්‍යාපෘති වියදම් සැකැස්මේ සත්‍ය වශයෙන් වසරේ දරණ ලද වියදම් හා ගෙවිය යුතු වියදම ගණනය කර දක්වා ඇත.	පොදුකර්යය පිරිවැය වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ලෙජර් ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඔ)	රු.41,531,283 ක් වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් වසර 05ක් ඉක්මවූ වූ වෙනත් ණයගැතියන් හා සේවක ණය එකතුව රු. 3,521,319 ක්ද වසර 1–5 ත් අතර කාලයට අදාල රු.882,493 කටද අදාළව අවශ්‍ය වෙන් කිරීම් ගිණුම්වල සලසා නොතිබු අතර එම ශේෂ අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය.	වසර 5 ඉක්මවූ රු.270,000 ලංකා ධීවර සංස්ථාවෙන් අයවිය යුතු තැන්පතුව අවලංගු කරගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බැවින් එම ශේෂය ඉදිරියට ගෙන යනු ලබයි. කොළඹ මහ නගර සභාවෙන් අයවියයුතු වසර 5 ඉක්මවූ රු.783,744 ක ණය ශේෂය තවම අයවී නොමැති අතර විශේෂ මුදල් අත්තිකාරම් වසර 1-5 ත් අතර අයවිය යුතු රු.205,300 න් රු.100,300 ක් අයවී ඇත.	ලැබියයුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගබඩා තොග වලට අදාළ බින් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබු අතර ඒ හේතුවෙන් 2025 මැයි 29 දින සිදුකළ ගබඩා භෞතික පරීක්ෂාවේදී එක් එක් අයිතම වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකි වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,809,139 ක්වූ තොගය සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුයෙන් අදාළ තොගවල පැවැත්ම සහ නිවරුදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	1,809,139	බින් කාඩ්පත්, තොග පොත්, ගබඩා ලෙජර් ගිණුම්	මේ වනවිට ගබඩා පරිපාලන හා මෙහෙයුම් කටයුතු විධිමත් කිරිමට කටයුතුකරමින් පවතින අතර පවතින මෙම ඌණතා නිවැරදි කිරීමට උපරිම උත්සහයක් ගනු ලැබේ.	ගබඩා තොගවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ආ)	වෙනත් ණයහිමි ශේෂය තුළ ඇතුළත් රු.11,777,414 ක්වූ වෙනත් ගෙවිය යුතු ශේෂයන්ට අදාළ මූලාශ්‍ර, ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂයේ නිරවද්‍යතාවය සනාථ කර ගත නොහැකි විය.	11,777,414	ශේෂ සනාථන ලිපි ජර්නල් සටහන්	වසර දෙකක පමණ සිට අදාල ගෙවිය යුතු මුදල ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය වෙත මහා භාණ්ඩාගාරයෙන් යොමු කර ඇති බව දැන ගැනීමට ලැබී ඇති හෙයින් අප විසින් මෙය නිරවුල් කර ගැනීමට ජාතික ජල ශාස්ත්‍රීය අංශය තුළින් විමසීමට කටයුතු කර ඇත. එය නිරාකරණය වන තෙක් මෙම මුදල ගෙවිය යුතු ලෙස පෙන්නුම් කරයි. අදාල පිළිතුර ලද පසු මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ශේෂ සනාථ කිරීමට අවශ්‍ය මූලාශ්‍ර, ලියකියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
i.	මුදල් රෙගුලාසි 104,105	සමුද්‍රීය අභිජනනාගාර මධ්‍යස්ථාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අත්තිකාරම් සුරක්ෂණය, කාර්යයසාධන සුරක්ෂණය හා ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවනාගාරය අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුවේ සුරක්ෂණයට අදාළව ලැබීමට තිබූ රු.4,263,649 ක මුදල	සමුද්‍රීය අභිජනනාගාර මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් පැවති තත්වය අමාත්‍යාංශ උපදෙස්, විගණන හා කළමනාකරණ කමිටු උපදෙස් මත අවසන් කිරීමට හැකිව ඇත. ඒ අනුව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ඉදිරියට නොගෙන යාමටත් පවතින තත්වයෙන් අවසන් කර අවසන් බිල ලබාගෙන එය පියවීමට කටයුතු සිදුකර ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් අවසන් බිල ඉදිරිපත් කර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	මේ වන විට සෘජුවම ආයතනයට අහිමි වී ඇති අතර ඒ සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනා ගැනීමටත් අදාළ අලාභය නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.	ආයතනයට අයවිය යුතු අත්තිකාරම් සුරක්ෂණය ඉන් අයකරගැනීමට කටයුතු කරනු ලබන අතර ඉන් අනතුරුව රු 118,000 ක පමණ මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට පවතින බව ඉංජිනේරුවරයා දන්වා ඇත. නාරා ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරීමේ කටයුත්ත මේ වන විටත් ආරම්භකර නොමැති බැවින් අදාල ඇපකරය අයකරගැනීමට කටයුතු කරන බවද දැනුම් දෙමි.	
ii. මුදල් රෙගුලාසි 135	මුදල් පාලනය සම්බන්ධ මූල්‍ය බලතල පවරා දීමේ ලේඛනය සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර මූල්‍ය බලතල පැවරීමේ ලේඛනයේ සීමාවන් දක්වා නොතිබුණි.	දැනට අනුගමන කරනු ලබන ක්‍රමවේදය වනුයේ ප්‍රධාන ගණන්දීමේ නිළධාරී විසින් ගණන්දීමේ නිළධාරී පත්කල පසු එම නිලධාරියාගේ බලතල වාර්ෂිකව පාලක මණ්ඩලය වෙත යොමු කර මුදල් රෙගුලාසි 135 අනුව බලය පැවරීමක් සිදුකිරීමයි. අනතුරුව මෙම ලේඛණය අමාත්‍යංශ ලේකම් වෙත දැනගැනීම හා අවශ්‍යය කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබයි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
iii. මුදල් රෙගුලාසි 177(1)	ඊකව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දෛනිකව එකතු වන මුදල් දිනපතා ප්‍රේෂණය නොකර මාසිකව ප්‍රේෂණය කර තිබුණි.	ඊකව මධ්‍යස්ථානයට දෛනිකව එකතුවන ප්‍රේෂණ ප්‍රමාණය සීමිත බැවින් සතියකට වරක් බැංකුවේ තැන්පත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරනු ලැබ ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
iv. මුදල් රෙගුලාසි 703 (1) (අ)	කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා වගකිව යුතු වුවත්, කඩොලාන පැළ තවානක් ඉදි කිරීමේ කොන්ත්‍රාත් ඉදිකිරීම සම්බන්ධයෙන් එය ඉටුවී නොතිබුණි.	ආයතනයේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු අධීක්ෂණය අධ්‍යක්ෂ (සේවා හා මෙහෙයුම්) යටතේ සිදුකරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ කඩොල්කැලේ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ කඩොලාන පැල තවාන ඉදිකිරීම සම්බන්ධයෙන් වාර්තා වන මෙම සිදුවීමේදී සහකාර අධ්‍යක්ෂවරයා විසින් අදාල ඉදිකිරීම අධීක්ෂණය	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		කලද,සැපයුම්කරුගේ මූල්‍යමය ගැටලු මේ සඳහා බලපා ඇත.	
v. මුදල් රෙගුලාසි 756, 770	2018 වසරේ සිට ගබඩාවේ අබලි ද්‍රව්‍ය ලෙස පවතින විවිධ යන්ත්‍රෝපකරණ හා යතුරුපැදි කොටස් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ මුදල් රෙගුලාසි පරිදි කටයුතු කිරීම හෝ කර නොතිබුණි.	මෙම යතුරුපැදි අළුත්වැඩියා කර ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල භාවිතය සඳහා ගැනීමට අවධානම් කලමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ සේවා හා මෙහෙයුම් වෙත උපදෙස් ලබාදී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.8 වගන්තිය	නාරා ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවනාගාරයේ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර මාස 06 ක් ගතවී ඇතත් කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර නොතිබුණු බැවින් අදාළ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට විගණිත දිනය වන 2025 අප්‍රේල් 28 දින දක්වා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.	මෙම කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයක් පැවතුණි.මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු ගෙන්වා සාකච්ඡා කරන ලදී.මෙම කාර්යය 2025 ජුනි මස 30 වන දිනට ප්‍රථම අවසන් කිරීමට එකඟ විය. කාර්යයසාධන සුරක්ෂණයෙහි වලංගු කාලය දීර්ඝ කිරීමටද කොන්ත්‍රාත්කරු එකඟතාවය පලකර ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුගත විය යුතුය.
(ඇ) 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/2022 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 3 (අ) වගන්තිය	වාහන අපහරණයෙන් ලද රු.382,500 ක්වූ මුදල් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුවද ඊට පටහැනිව එම මුදල ආයතනයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.	2024 පෙබරවාරි මස 15 දින වාහන අපහරණය කිරීමෙන් රු.382,500 ක මුදලක් ලද අතර එය ආයතනයේ ගිණුමේ තැන්පත් කර ඇත. මෙම මුදල මහා භාණ්ඩාගාරය වෙත යොමුකිරීමට කටයුතු කරන ලබන බව දැනුම්දෙමි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.24,239,410 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.52,984,328 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.77,223,738 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් රු.16,957,954 කින් අඩුවීම, පුද්ගලික පඩිනඩි, ගමන්වියදම් හා සංයුක්ත දීමනා, සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය, පර්යේෂණ හා සංවර්ධන වියදම්, වෙනත් මෙහෙයුම් වියදම් හා ව්‍යාපෘති උපදේශන වියදම් පිළිවෙළින් රු.24,956,943, රු.1,320,984, රු.672,340, රු.9,757,233, රු.20,409,401 හා රු.53,907,064 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමුද්‍රීය අභිජනාගාර මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පුද්ගලික සමාගමක් වෙත රු.5,880,989 ක්වූ අත්තිකාරම් මුදලද ඇතුළුව රු.15,937,388 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින වනවිට කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද ඉදිකිරීම් අතරමග නවතා දමා ඇති බැවින් එම වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. තවද ගෙවා තිබූ මුළු අත්තිකාරම් මුදලින් අයකර නොගත් රු.2,432,290 ක්වූ අත්තිකාරම් මුදල අය කර ගැනීම සඳහා රු.6,986,615 (VAT සහිත) ක් වූ 2021 පෙබරවාරි 04 දින කල් පිරෙන අත්තිකාරම් සුරක්ෂණයත්, රු.1,746,654 ක්වූ 2022 මාර්තු 18 වන දින කල් පිරෙන කාර්යසාධන සුරක්ෂණයත් කල් ඉකුත් වී තිබූ අතර එම සුරක්ෂණ සඳහා දින දීර්ඝ කර ගැනීමට හෝ මුදල් කර ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණි.	මේ වන විට මේ සම්බන්ධයෙන් පැවති ගැටලුකාරී තත්වයන් අවසන් කර ගැනීමට හැකි වී තිබේ. දෙන ලද විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත පැවති කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කරන ලදී. කොන්ත්‍රාත්කරු මේ සඳහා අවසන් බිල ඉදිරිපත් කර ඇත. පෙර මේ සම්බන්ධයෙන් දැනුම් දී ඇති පරිදි ආයතනය වෙත අලාභයක් සිදුවී නොමැති අතර, ආයතනය විසින් සියළු අයකිරීම් අයකරගත් පසු තව දුරටත් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු මුදල රුපියල් 118,000 ක් පමණ බව ඉංජිනේරුවරයා වාර්තා කර ඇත.	අතරමග නවතා දමා ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වන කාර්යසාධන සුරක්ෂණ හා අත්තිකාරම් සුරක්ෂණ වල දින දීර්ඝ කර ගැනීමට හා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) සේවය හැරගිය නිලධාරියෙකුගෙන් ආයතනයට අය විය යුතු රු.5,874,798 ක්වූ මුදල සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා රු.587,479ක මුදලක් වසරකට වාරික දෙක බැගින් වසර පහක් තුළ ගෙවීමට 2022 වර්ෂයේදී සමථයකට පත්ව තිබුණි. ඒ අනුව 2024 වර්ෂයට අදාළව ලැබිය යුතු මුළු මුදලින් රු.592,273 ලැබී තිබූ අතර රු.2,467,575 ක්වූ හිඟ මුදල අයකර ගැනීමට නියෝජීතායතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2025 ජූලි මාසය අවසානය වන විට සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කරන බව අදාල නිලධාරියා විසින් 2025 ජුනි 16 දින ඊමේල් පණිවිඩයක් මඟින් දන්වා ඇත.	හිඟ මුදල අයකර ගැනීමට නියෝජීතායතනය කටයුතු කළ යුතුය.

(ඇ) කඩොලාන පැළ තවානක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව ඉදිකිරීමේහි කිසිදු කාර්යයක් ඉටුකර නොතිබියදී කොන්ත්‍රාත් ආයතනයට 2024 දෙසැම්බර් 30 දින රු.1,518,901 ක් ගෙවා තිබුණි.	වැඩ කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයක් පැවතුනද, මෙම මුදල නිශ්කාර්ය වියදමක් වීමට ඉඩ සලසා නැත. මෙම කාර්යය 2025 ජුනි මස 08 දින වනවිට නිම කිරිමට අවශ්‍ය එකගතාවයන්ට පැමිණ ඇත. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ වී අදාල අරමුණ සම්පූර්ණ කරගත හැකිවේ.	සැලසුම් පරිදි නියමිත පරිදි කාලසීමාව තුලදී ඉදිකිරීම් ඉටුකරවා ගත යුතුය.
(ඈ) විදේශ පුහුණුවක් සඳහා විදේශ ගතවී සිටින අංක 744 දරන නිළධාරියා 2024 මැයි 18 දින නැවත සේවයට වාර්තා කළයුතු වුවත් එසේ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2024 ජුනි 07 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ NARA/ADM/02/0605/744/23 ලිපිය අනුව ඔහු සේවය හැරගිය නිළධාරියෙකු ලෙස නම්කර තිබුණි. 2024 සැප්තැම්බර් 10 පැවති 476 පාලක මණ්ඩල රැස්වීමේ තීරණය අනුව බැඳුම්කර වටිනාකමින් තවදුරටත් පියවී නොමැති රු.1,228,744 මුදල ඇපකරුවන්ගෙන් 2025 පෙබරවාරි මස සිට අය කළයුතු බවට තීරණය කර තිබුණද විගණිත දින 2025 මැයි 08 වන විටත් එම ශේෂය අයකිරීමට කටයුතු කර නොතිබුණි.	මෙහිදී ඇපකරුවන්ගෙන් අය කර ගත යුතු ප්‍රමාණය හා ගණනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා ප්‍රමාද විය. 2025 මැයි මස සිට අදාල ඇපකරුවන්ගෙන් අයකිරීම් සිදුකර ඇත.	හිඟ මුදල අයකර ගැනීමට නියෝජ්‍යතායතනය කටයුතු කළ යුතුය.
(ඉ) 2014 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කරන ලද රු.42,500,000 ක් වූ හෙක්ටයාර් 20.7582 වූ රැකව ඉඩමේ අයිතිය මේ වන විටත් පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.	1981 අංක 54 දරණ පනතේ 35 වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයක් මගින් භුක්තිය සඳහා හිමිකම් ලබාගැනීම ප්‍රමාණවත් බව අප විසින් රේඛීය අමාත්‍යාංශට දන්වා ඇත.	ඉඩමේ අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ මත්ස්‍ය ප්‍රවර්ධනය සඳහා හැවරි 06 ක ඉදිකර තිබූ ටැංකි 87 න් ටැංකි 33 ක් විගණන අවස්ථාව වූ 2025 පෙබරවාරි 25 දින වන විට භාවිතයට ගෙන නොතිබුණි. ඉන් ටැංකි 21 ක් වසර ගණනාවක සිට භාවිතයට නොගෙන පවතින අතර එම ටැංකි තුළට විශාල ගස්වල මුල් පද්ධති වර්ධනය වී තිබුණු අතර දැනට භාවිතා	මත්ස්‍ය අභිජනනාගාර දෙකක් ආශ්‍රිතව ගස්වල මුල් වැවීම මත ජල කාන්දුවීම සිදුවේ. මෙම ගස් ඉවත් කිරීම සඳහා පවතින රජයේ ක්‍රමවේදයට අනුව රාජ්‍ය දැව සංස්ථාව වෙත දන්වා ඇත. මෙම ගස් ඉවත්කර ටැංකි පිළිසකර කර පසු නැවත අභිජනනාගාර කටයුතු ආරම්භ කරනු ලැබේ.අතීතයේ රැකව ප්‍රාදේශීය	මත්ස්‍ය ටැංකි උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

කරන මත්ස්‍ය ටැංකිද විධිමත්ව නඩත්තු කර නොතිබුණි. තවද මිලදී ගත් වර්ෂයක් සහ වටිනාකමක් හඳුනාගත නොහැකි වූ රවුම් හැඩයේ විශාල ටැංකි 03ක් ද මධ්‍යම ප්‍රමාණයේ ටැංකි 02ක්ද කුඩා ප්‍රමාණයේ ටැංකි 02ක්ද වශයෙන් වූ ෆයිබර් ග්ලාස් ටැංකි 07 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මධ්‍යස්ථාන පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.	මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘති සඳහා මෙම ෆයිබර් ටැංකි ප්‍රයෝජනයට ගෙන ඇත. නමුත් කාලයක් සමඟ මෙම ටැංකි දිරාපත් වී ඇත. ඒවායින් නැවත ප්‍රයෝජනයට ගැනීමට හැකි ටැංකි මොනවාද යන්න සොයා බලා ඒවා නැවත පිළිසකර කර ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වේ.	
(ආ) රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා 2025 පෙබරවාරි 25 දිනට නිළධාරීන් 14 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර 2024 වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ පරිපාලන වියදම් වෙනුවෙන් රු.18,105,639 ක වැයකර තිබුණද ප්‍රමාණවත් පරිදි පර්යේෂණ කටයුතු සිදුකර නොතිබුණි. 2023 හා 2024 වර්ෂයන්හිදී ප්‍රධාන කාර්යාලය විසින් මධ්‍යස්ථානයේ කටයුතු සම්බන්ධයෙන් විධිමත්ව අධීක්ෂණයක් සිදුකර අරමුණු කරා මෙහෙයවීමට කටයුතු කර නොතිබුණි.	මෙම මධ්‍යස්ථානයේ කරනු ලබන පර්යේෂණ කටයුතු සීමිත බැවින් ජනිත වන ආදායම පහළ අගයක් ගනී. නමුත් සේවක පඩිනඩි ගෙවීම් අනිවාර්යයෙන් දැරිය යුතු බැවින් ඒ සඳහා එතරම් විශාල මුදලක් වැයවේ. තවද, රැකව මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත්තේ ලාභ ඉපයීමේ අරමුණින් නොවන අතර හුදෙක්ම පර්යේෂණ කටයුතු සිදුකිරීමට පමණක් බව විශේෂයෙන් සඳහන් කල යුතුය. මේ ආකාරයේ මුදලක් හෝ උපයාගෙන ඇත්තේ පර්යේෂණ කටයුතු අවසන් වී ඉතිරිවන මත්ස්‍ය සම්පත අලෙවි කිරීම තුළින්ය.	මධ්‍යස්ථානයේ කටයුතු සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් සිදුකළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)මධ්‍යම විද්‍යාගාර සංකීර්ණ ව්‍යාපෘතියෙහි උපදේශන සේවා කොන්ත්‍රාත්තුවට අදාළව 2018 වර්ෂයේදී දරා තිබූ රු.3,900,673 ක උපදේශන සේවා ගාස්තුව අදාල කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබීම හේතුවෙන් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.	2017 අගෝස්තු 09 වන දින අමප/17/1635/725/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබාදීමේ එකගතාවය මත මෙම කාර්යය ආරම්භ කරන ලදී. පසුව රට තුල පැවති ආර්ථික අයහපත් තත්වය මත මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු නොකරන ලදී. නමුත් මේ වන විටත් වෙනත් විකල්ප ආධාර ලබාගැනීමේ අවස්ථාවන් සලකා බලමින් සිටින බව කාරුණිකව දැනුම් දෙමි.	කොන්ත්‍රාත්තුව සැලසුම් කළ පරිදි නිම කළ යුතුය.
(ආ) 2020 වර්ෂයේ ආරම්භ කළ කල්පිටිය අභිජනනාගාර සංකීර්ණයක් ඉදිකිරීම සහ 2019 වර්ෂයේ ආරම්භ කළ බහු විශේෂ අභිජනනාගාරයක් ඉදි කිරීමේ ව්‍යාපෘති මේ වන විට නවතා දමා ඇති හෙයින් ඒ සඳහා වැය කළ එකතුව	කල්පිටිය ප්‍රදේශයේ මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකිරීම සඳහා මූලික සැලසුම් සකසා ක්‍රියාවට නංවන ලදී. පසුව රට තුල පැවති ආර්ථික අයහපත් තත්වය මත මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු නොකරන	කොන්ත්‍රාත්තුව සැලසුම් කළ පරිදි නිමකළ යුතුය.

රු.1,814,971 ක් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.	ලදී. 2024 වසරේ මේ සඳහා ඉන්දීය රජයේ ආධාර ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී. තවදුරටත් වෙනත් විකල්ප ආධාර ලබාගැනීමේ අවස්ථාවන් සලකා බලමින් සිටින බව කාරුණිකව දැනුම් දෙමි.	
(ඇ) කල්පිටිය කුඩාව ප්‍රදේශයේ බහු විශේෂ මත්ස්‍ය අභිජනනාගාර සංකීර්ණයක් ඉදි කිරීම සඳහා අක්කර 03 ක ඉඩමක් 2022 පෙබරවාරි 16 දින සිට අවුරුදු 30ක කාලයකට බදු ගැනීමටත් පෙර 2020 වර්ෂයේදී එම ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා රු.1,631,963 ක වියදමක් දරා තිබුණි. මෙම ඉඩම අදාළ අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණු අතර ඉඩම විශාල වශයෙන් වල්බිහිවී ප්‍රයෝජනයට නොගෙන ඌණ උපයෝජිතව පැවති බවත් ඉඩම වටා ඉදිකර තිබූ කම්බි දැල් ආවරණය නිසි නඩත්තුවක් නොමැතිවීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවති බවත් 2025 ජුනි 17 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	මෙම ඉඩම ඉන්දියානු රජයේ සහයෝගයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත වන අතර, එහි කටයුතු තවමත් අවසන් වී නොමැති බැවින් තවදුරටත් මෙම ඉඩම ඒ ආකාරයෙන්ම පවතී. එම කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කරමි.	ඉඩම් සංවර්ධන කර අරමුණු කරා මෙහෙයවිය යුතුය.
(ඇ)2011 වර්ෂයේ රු. මිලියන 12ක් වැයකර නිපදවන ලද “තරණි” යාත්‍රාව කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂ 10කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	තල්මසුන් නිරීක්ෂණය සඳහා කල අත්හදා බැලීමක් ලෙස මෙම යාත්‍රාව නිෂ්පාදනය කර ඇත. මෙය අසාර්ථකවී ඇති අතර මේ වන විට ආයතනය වෙත පැමිණෙන සිසුන්ගේ අධ්‍යනය කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.	යාත්‍රාව සුදුසු කාර්යයක් සඳහා යොදාගත යුතුය.
(ඉ)රු.7,512,800 ක වටිනාකමක් සහිත බෙල්ලන් ආකෘති 9391ක තොගයක් වසර ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	මෙම කෘතිම බෙල්ලන් ආකෘති නාරා ආයතනයට ප්‍රදානයන් ලෙස ලැබී පර්යේෂණ සඳහා ප්‍රයෝජනයට ගෙන අදාල වාර්තා ලබාදී ඉතිරිව පවතින තොග වේ. 131 වෙනි විගණන හා කළමනාකරණ කමිටුව මඟින් එම තොග සම්බන්ධයෙන් ද සිදු කළ හැකි ක්‍රියා සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස කළ නිර්දේශ ප්‍රකාරව වාර්තාවක් විගණන හා කළමනාකරණ කමිටුව වෙත ලබා දෙන ලදී. ඒ අනුව මෙම තොග ධීවරයින් වෙත බෙදා දීමට හෝ ධීවරයින් සමඟ ඉදිරි පර්යේෂණයන් සඳහා භාවිතා කිරීමට නිර්දේශ දී ඇත.	බෙල්ලන් ආකෘති සුදුසු පර්යේෂණ කටයුත්තක් සඳහා යොදාගත යුතුය.

(ඊ)නියෝජිතායතනයේ පසු අස්වනු තාක්ෂණ අංශයේ වටිනාකම රු.21,373,564ක් වූ රසායනාගාර උපකරණ 3ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි උපකරණ 2ක් නිෂ්කාර්යව පැවතුණි.	එක් රසායනාගාර උපකරණයක UPS පද්ධතිය විදුලි අක්‍රමිකතාවයක් හේතුවෙන් ක්‍රියා විරහිත වූ බැවින් නැවත නව UPS පද්ධතියක් ලැබුණු පසුව විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමටද තවත් උපකරණයක හීලියම් වායුව අවසන් වී ඇති බැවින් එම වායුව ලැබුණු පසු විශ්ලේෂණ කටයුතු නැවත ආරම්භ කිරීමටද බලාපොරොත්තු වේ අනෙක් උපකරණය අමතර කොටස් නොමැති බැවින් අත්හිටුවීම සිදුකර ඇත. වර්තමානයේ හිස්ටැමීන් පරාමිතිය සඳහා ප්‍රතීතන සහතිකය ලබා ගැනීමට කටයුතු කළ බැවින් හඳුනාගත නොහැකි උපකරණ 2හි දත්ත සියල්ල ඉදිරියේදී ලබා දීමට බලාපොරොත්තු වේ.	රසායනාගාර උපකරණ උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතයට ගත යුතුය.
(උ) රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානය සතුව සංචාරක වටිනාකමක් සහිත කළපුවක් ආශ්‍රිතව පිහිටි හෙක්ටයාර් 20.7582 ක්වූ භූමි ප්‍රමාණයෙන් කාර්යාලය සහ මත්ස්‍ය ටැංකි පිහිටි ඉඩම් කොටස හැරුණු විට මුළු ඉඩමේ ඉතිරි භූමි ප්‍රමාණය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණු බව 2025 පෙබරවාරි 25 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද මධ්‍යස්ථානයේ සිට කලපුව නැරඹීමේ අරමුණින් ඉදිකිරීමට කටයුතු කර තිබුණු නැරඹුම් මැදිරිය අතරමග නවතා දමා වල් බිහිවී තිබුණු අතර ඒ හේතුවෙන් මිලදීගත් ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් වැය කරන ලද රු.475,170ක් නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි.	මෙම ආයතනය පර්යේෂණ කටයුතු සිදුකරන බැවින් අවට පරිසරයේ නිසොල්මන් බව සහ නිශ්ශබ්දතාවය රාජකාරීන් සඳහා මහෝපකාරී වේ. එබැවින් අදාල ඉඩම් කොටස ඉතා සුපරීක්ෂාකාරීව සංවර්ධනය කිරීම හෝ භාවිතා කිරීම සිදුකල යුතුව ඇත.එසේම නැරඹුම් මැදිරිය ඉදි කිරීමට රැගෙන ආ අමුද්‍රව්‍ය අතරින් වැස්සෙන් ආරක්ෂා විය යුතු ද්‍රව්‍ය ආරක්ෂාකාරීව ගබඩා කරන ලදී. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අවසන් කරන ලෙස අධ්‍යක්ෂ සේවා මෙහෙයුම් දැනුවත් කර ඇත.	නැරඹුම් මැදිරිය ඉදිකිරීමේ කාර්යය සැලසුම් පරිදි නිම කිරීමටත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන භූමිය උපරිම ඵලදායිතාවයකින් ප්‍රයෝජනයට ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඌ)කල්පිටිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු අතර පර්යේෂණ කටයුතු සිදුකිරීම එක් අරමුණක් වුවද පර්යේෂණ කටයුතු සඳහා ඉදිකිරීම් කර තිබූ අභිජනනාගාර විගණිත දිනය වූ 2025 ජුනි 17 දින වනවිට පර්යේෂණ කටයුතු සඳහා භාවිතයට නොගෙන විනාශ වෙමින් පැවතුණි. තවද කඩොලාන වගා උද්‍යානයක් මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම	වසර ගණනාවක් මෙම අභිජනනාගාරය භාවිතයට නොගෙන තිබූ අතර මේ දක්වා ඒ සඳහා අවශ්‍යතාවයක් ද පැන නැඟී නැත. එබැවින් අළුත්වැඩියා කටයුතු සඳහා 2026 වසරට ද ඇතුලත් කර නොමැත.	ප්‍රාදේශීය මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

එම මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණක් වුවද විගණිත දිනය වන 2025 ජූනි 17 දින වන විටත් එම අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.		
(ඉ) කල්පිටිය ප්‍රාදේශීය මධ්‍යස්ථාන ගබඩා පරිශ්‍රයතුළ ප්ලාස්ටික් කොටු දැල් රෝල් 15 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන තිබුණු අතර ප්ලාස්ටික් ටැංකි සහ වෙනත් උපකරණ කිහිපයක්ද ප්‍රයෝජනයට නොගෙන දිරාපත් වීමට ඉඩහැර තිබුණි.	මෙම සියලු ද්‍රව්‍ය වල කාලය ඉකුත් වී ඇති බැවින් අදාල තොග පොත් වල ලියාහැර ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරනු ඇත.	අවශ්‍යතාවය හඳුනාගෙන භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.